## හම්බන්තොට මහා නගර සභාව
## හම්බන්තොට දිස්ත්‍රික්කය

### 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 සැප්තැම්බර් 17 දිනද , ඉකුත් වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස දෙකක කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජනවාරි 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 දෙසැම්බර් 24 දින නගරාධිපතිවරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හම්බන්තොට මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) හම්බන්තොට නගර සභාව මහා නගර සභාවක් බවට පත් කිරීමෙන් පසුව හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරන ලද රු. 68,002,818 ක වත්කම් හා රු. 4,262,501 ක වගකීම් නීත්‍යානුකූලව පවරා ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝ අනුමත කර ඇති හෝටල් හෝ තානායම් වලින් අයකරනු ලබන සියයට 1 ක බලපත්‍ර ගාස්තු ලෙස හම්බන්තොට තානායමෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ රු. 77,007 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 1,770,492 ක් වුවද ගිණුම්ගත කර තිබුණු මුදල රු. 1,172,208 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් රු. 769,916 ක් ගිණුම්ගත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 922,297 ක් වුවද ගිණුම්ගත කර තිබුණු මුදල රු. 244,516 ක් විය.

(ඉ) 1998 අගෝස්තු මාසයේ සිට 2011 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව ලැබී තිබුණු රු. 3,511,667 ක තානායම් කුලී මුදල සමුච්චිත අරමුදලට බැර නොකොට සමාලෝචිත වර්ෂයේ ආදායමට බැරකර තිබූ අතර 2012 දෙසැම්බර් මාසයට අදාලව ලැබිය යුතු රු. 160,000 ක තානායම් කුලී මුදලද ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ගිණුම් විෂයයන් 08 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් අනුව සහ ලේඛනය අනුව රු. 2,734,458 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) විවිධ ආයතන වලින් සහ පුද්ගලයන්ගෙන් හම්බන්තොට හා ඉදිවින්න මහජන පුස්තකාලයන් සඳහා ලැබී තිබූ එකතුව රු. 44,710 ක පුස්තකාල පොත් වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 79,414,200 ක් වූ ගිණුම් විෂයයන් 22 කට අදාල ලිඛිත සාක්ෂි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,783,948 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | | 000' | 000' | 000' |
| (i) | වරිපනම් හා බදු | 3,770 | 3,779 | 2,190 |
| (ii) | බදුකුලී | 9,402 | 12,258 | 423 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | බලපතු ගාස්තු | 365 | 1,196 | - |
| (iv) | වෙනත් ආදායම් | 48,410 | 23,564 | 2,012 |

2.2.2 වරිපනම් බදු
--------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ 230(1) වගන්තිය ප්‍රකාර 2011 නොවැම්බර් මස හම්බන්තොට ප්‍රාදේශීය සභාවෙන් පවරන ලද කොහොලංකල , සිරිබෝපුර , කැලියපුර , සාමෝදාගම හා මිරිජ්ජවිල යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල වරිපනම් බදු තක්සේරු කර නව කුලී අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු මුදල රු. 1,880,118 ක් වූ අතර හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීම සඳහා මහා නගර සභා ආඥ පනතේ 252 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. 2012 ඔක්තෝබර් 08 දින වන විට මෙම හිඟ වරිපනම් බදු මුදලින් රු. 235,331 ක් අයවී ඇති බව නගරාධිපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඇ) හම්බන්තොට බටහිර හා හම්බන්තොට නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් වල වරිපනම් බදු 2011 වර්ෂයේ නැවත තක්සේරු කර තිබුණද එම නව තක්සේරුවට අනුව වරිපනම් අයකර ගැනීමට 2012 වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. සභාවේ අනුමැතිය මේ සඳහා ලැබී නොතිබුණු බැවින් තක්සේරුව අනුව වරිපනම් අයකිරීමට නොහැකි වූ බව නගරාධිපතිවරයා වාර්තා කර තිබුණි.

2.2.3 කඩකුලී
---------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුලී මුදල රු. 573,334 ක් වූ අතර මහා නගර සභා ආඥා පනතේ 253(1) වගන්තිය ප්‍රකාර මෙකී හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලීනව කඩකාමර කුලී මුදල් ගෙවීම පැහැර හැර ඇති බදුකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු හිඟ මුදල රු. 311,191 ක් විය.

(ඇ) තොග මාළු වෙළඳපල කඩකාමර 05 කින් වර්ෂය අවසානයට රු. 69,000 ක කුලී මුදලක් හිඟව තිබුණි. බදුකරුවන් සමග බදු ගිවිසුම් වලට එළඹ නොතිබීම නිසා හිඟ කුලී අයකර ගැනීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍රලේඛයේ 5 ඡේදය අනුව සෑම කුලී ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් මහා නගර සභාව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු. 1,172,208 ක උසාවි දඩ මුදලක් හා රු. 244,516 ක මුද්දර ගාස්තු මුදලක් ලැබිය යුතුව තිබුණි.

2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

ට්‍රැක්ටර් 5 ක් සහ යතුරු පැදියක් 2013 ඔක්තෝබර් 02 දිනවන විට වසරකට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින බව අනාවරණය වූ අතර එම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 අවිධිමත් ගනුදෙනු

නිවාඩු අනුමත කර නොගෙන 2012 මාර්තු 21 දින සිට 2012 මැයි 11 දින දක්වා විදේශගත වී සිටි මන්ත්‍රිවරයෙකුට 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 1413/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ විධිවිධාන වලට පටහැනිව 2012 මැයි 11 දින මාර්තු මාසයට අදාල ඉන්ධන හා සභික දීමනා හා අප්‍රේල් මාසයට අදාල සභික දීමනාව ලෙස රු. 16,500 ක මුදලක් ගෙවා තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂය තුළ මගනැගුම වැඩසටහන යටතේ වරාය හා මහාමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අනුමත කර තිබූ රු. 1,500,000 ක් වටිනා කර්මාන්ත තුනක් 2013 අප්‍රේල් 24 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මගනැගුම වැඩසටහන යටතේ කෙයාර් ගම්මානයේ අනුර මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය 1 අදියර ඉදිකිරීම් කටයුතු 2012 අගෝස්තු 24 දින රු. 499,312 ක ගිවිසුම්ගත මුදලකට අනුමත සමිතියකට පවරා ඉටුකරවා ගෙන රු. 492,648 ක මුදලක් ගෙවා තිබුණි. 2013 අප්‍රේල් 23 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) මාර්ග උරහිස් වර්ෂාවට සෝදා ගෙන ගොස් තිබීම.

(ii) මාර්ගයේ දෙපස සඳහා යොදා තිබූ කොන්ක්‍රීට් ගැටි කැඩී තිබීම හා කොන්ක්‍රීට් ගැටි කැඩී යාම හේතුවෙන් කොන්ක්‍රීට් කුට්ටිගල් ගැලවී තිබීම.

(iii) මාර්ගයේ කොන්ක්‍රීට් කැටගල් ගැලවී යාම නිසා මාර්ගය ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්වෙමින් තිබීම.

(ඇ) 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව ත්‍රී පුද්ගල කමිටුවක් මගින් නිර්දේශ ලබාගෙන ප්‍රජා සංවිධාන සඳහා කොන්ත්‍රාත් පැවරීම කළයුතු වුවත් 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලැබූ කර්මාන්ත සඳහා එසේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විවිධ පාර්ශවයන්ගෙන් සහ ආයතන වලින් ලැබී තිබූ සහ අයකරන ලද එකතුව රු. 3,228,878 ක මුදලක් මිශ්‍ර තැන්පත් යටතේ වර්ෂය අවසානයට දක්වා තිබූ අතර කල්ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මහා නගර සභාව විසින් 2012 වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ලේඛනයේ වර්ෂය තුල ඉටුකිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා හා මන්ත්‍රී යෝජනා කිසිවක් ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ අයවැය ලේඛනයේ ප්‍රාග්ධන ආදායම් ලෙස රු. 2,300,000 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද ප්‍රාග්ධන වියදම් ලෙස ඇස්තමේන්තු කර තිබුණු මුදල රු. 165,000 කි. ඇස්තමේන්තුකරණය අතත්වික නොවිය.

(ඈ) වාර්ෂික අයවැය ලේඛනයේ දක්වා තිබූ ආදායම් සහ වියදම් ඇස්තමේන්තු වල අගයන් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ඉතා ඉහල විචලනයක් පෙන්නුම් කෙරෙණි.

2.7 අභ්‍යන්තර විගණනය
-----------------------
සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. පද්ධති හා පාලන
------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය